2024 ජනවාරි

Lanka Nippon BizTech Institute

LNBTI
LANKA NIPPON BIZTECH INSTITUTE

Japanese IT University

# NEWSLETTER



## ඇතුළත තොරතුරු


- JICA - LNBTI වැඩමුළුව සමඟින් ශ්‍රී ලංකා-ජපාන සබඳතා ශක්තිමත් වේ
- LNBTI, ජපානයේ Saitama තාක්ෂණ ආයතනයේ නියෝජිත කණ්ඩායමක සත්කාරකත්වය දරයි
- Chio Horiuchi මහත්මිය LNBTI සිසුන් සමග ජපන් ජීවිත අත්දැකීම් බෙදා ගනී
- අධ්‍යාපනික සැලසුම් උදෙසා LNBTI, Yoshida Shokanji ජාත්‍යන්තර පාසලට
- LNBTI, ජපානයේ වෘත්තිය අවස්ථා පිළිබඳව අධ්‍යාපනඥයින් දැනුවත් කරයි
- ජපාන Fukuoka ආර්ථික විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා සීමාවන් ගවේෂණය
- වෘත්තීන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ අපේක්ෂාවෙන් ජපන් නියෝජිත කණ්ඩායමක් LNBTI වෙත
- සංස්කෘතික හුවමාරුව විදහා දැක්වූ මහානාම විද්‍යාලයේ ජපන් වැඩමුළුව
- LNBTI විසින් පානදුර බාලිකා විද්‍යාලයේ පැවැත්වූ IoT වැඩමුළුව
- අලුතින් ආරම්භ කළ City Campus


## JICA - LNBTI වැඩමුළුව සමඟින් ශ්‍රී ලංකා-ජපාන සබඳතා ශක්තිමත් වේ



2023 දෙසැම්බර් 6 වන දින, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සාමාජිකයින් දෙදෙනෙකු සහ නියෝජිතයෙකුගේ මෙහෙයවීමෙන් වැඩමුළුවක් පැවැත්වීමේ වරප්‍රසාදය LNBTI සතු විය. ශ්‍රී ලංකාව සහ ජපානය අතර සංස්කෘතික සබඳතා වැඩිදියුණු කිරීම මෙම වැඩමුළුවේ මූලික අරමුණ විය. දූත පිරිස LNBTI සිසුන් සමඟ පුළුල් වැඩමුළුවක සහ සාකච්ඡාවක නිරත වූ අතර, මෙරට සිසුන් සඳහා ජපාන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ ඇති ඉහළ අවස්ථාවන් පිළිබඳව විශේෂ අවධානය යොමුවිය. මෙම වැඩමුළුව හේතුවෙන් ජපානයේ වෘත්තීන් වල නිරත වීමට මෙරට සිසුන්ගේ ඇති උනන්දුව වර්ධනය වූවා පමණක් නොව, ඔවුන්ගේ කුසලතා සහ සංස්කෘතික අවබෝධය පිළිබඳව ජපාන විශේෂඥයින්ගෙන් ධනාත්මක ප්‍රතිචාරය ද හිමි විය.




Lanka Nippon BizTech Institute
No. 278, High-Level Road, Maharagama


www.lnbti.lk

## LNBTI, ජපානයේ Saitama තාක්ෂණ ආයතනයේ නියෝජිත කණ්ඩායමක සත්කාරකත්වය දරයි

2023 දෙසැම්බර් 6 වන දින LNBTI ආයතනය, Saitama තාක්ෂණ ආයතනයේ මහාචාර්යවරුන් දෙදෙනෙකු හට මෙරට සංචාරය සඳහා සත්කාරකත්වය ලබා දීමේ ගෞරවය ලබා ගනා ලදී. ඔවුන්ගේ සංචාරයේ මූලික පරමාර්ථය වූයේ LNBTI සහ Saitama තාක්ෂණ ආයතනයේ සිසුන් අතර සහයෝගීතාව වර්ධනය කිරීමය. සංචාරය අතරතුර, Saitama තාක්ෂණ ආයතනයේ සිසුන් 20 දෙනෙකු 2024 මාර්තු මාසයේදී අධ්‍යාපනික සංචාරයක් සඳහා මෙරටට පැමිණීම හා ආයතන දෙක අතර විශේෂ සැසියක් සංවිධානය කිරීම පිළිබඳව ද සාකච්ඡා විය. මෙම අධ්‍යයන මෙහෙයුම හරහා දෙරටේ සිසුන්ට සුවිශේෂී අවස්ථාවක් ලබා දීම මෙහි අරමුණයි.





## Chio Horiuchi මහත්මිය LNBTI සිසුන් සමඟ ජපන් ජීවිත අත්දැකීම් බෙදා ගනී

ජපානයේ සිට පැමිණි Chio Horiuchi මහත්මිය පසුගියදා ශ්‍රී ලංකාවේ ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය වන LNBTI ආයතනයේ සංචාරයක නිරත විය. ඇයගේ ආකර්ශණීය සැසිය අතරතුර, ජපානයේ ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා දෙමින් උපාධි අපේක්ෂකයින් සමඟ සමීප සාකච්ඡාවක ද ඇය නිරත විය. එදිනෙදා සේවාවන්ට ජපන් තාක්ෂණය සම්බන්ධ වන ආකාරය පිළිබඳ ඇයගේ දැනුම්වත්කිරීම් සිසුන්ගේ විශේෂ අවධානයට ද ලක්විය. Horiuchi මහත්මියගේ සංචාරය සිසුන්ගේ සංස්කෘතික අවබෝධය පුළුල් කළා පමණක් නොව ජපානයේ නව තාක්ෂණික සන්දර්භය සඳහා උද්‍යෝගයක් ද ඇති කළේය.

## විශිෂ්ඨ අධ්‍යාපනික සැලසුම් උදෙසා LNBTI, Yoshida Shokanji ජාත්‍යන්තර පාසලට පැමිණෙයි



LNBTI ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය මෑතකදී LNBTI හි ප්‍රමුඛ ශාඛා පාසලක් සහ ශ්‍රී ලංකාවේ කීර්තිමත් ජපන් පාසලක් වන Yoshida Shokanji ජාත්‍යන්තර පාසලේ විශේෂ සංචාරයක නිරත විය. මෙම සංචාරයේ දී මූලික අවධානය යොමු වූයේ සිසුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය ගමන් මගට සැලකිය යුතු ලෙස බලපාන සහයෝගීතා රාමුවක් ස්ථාපිත කිරීම සහ අනාගත අධ්‍යාපන සැලසුම් පිළිබඳව සාකච්ඡා කිරීමයි.

## LNBTI, ජපානයේ වෘත්තිය අවස්ථා පිළිබඳව අධ්‍යාපනඥයින් දැනුවත් කරයි



LNBTI ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය, 2023 දෙසැම්බර් 15 වන දින කොළඹ ප්‍රදේශයේ ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා තොරතුරු සැසියක් පැවැත්වීය. ශ්‍රී ලාංකීය සිසුන් සඳහා ජපානයේ ඇති වෘත්තිය අවස්ථා පිළිබඳව ඔවුන් දැනුම්වත් කිරීම මෙහි මූලික අරමුණ විය. සිසුන්ට ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ ගෞරව උපාධියක් හැදෑරීමට ඇති අවස්ථා සහ උපාධිය ලැබීමෙන් පසු ජපානයේ තොරතුරු තාක්ෂණ රැකියාවක් ලබා ගැනීමේ හැකියාව LNBTI විසින් මෙහිදී ඉදිරිපත් කළේය. මෙම සැසිවාරයේ විශේෂිත අංගයක් වූයේ, ජපන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට බාධාවකින් තොරව පිවිසීමට අවශ්‍ය ජපන් භාෂාව සහ සංස්කෘතිය හරහා සිසුන්ට මඟ පෙන්වීම සඳහා LNBTI විසින් මෑතකදී බඳවා ගත් ජපන් ජාතික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය Toshiyuki Sadoi  මහතාව හඳුන්වාදීමයි.



## ජපාන Fukuoka ආර්ථික විශ්වවිද්‍යාලය සමඟ සහයෝගීතා සීමාවන් ගවේෂණය

LNBTI ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය සිය සහයෝගීතාවයේ තීරණාත්මක අවස්ථාවක් සනිටුහන් කරමින්, Fukuoka ජපාන ආර්ථික විද්‍යා විශ්වවිද්‍යාලයේ මහාචාර්ය Katsunori Takahashi මහතා වෙත මෙරට සංචාරයක් සඳහා සත්කාරකත්වය පිරිනැමීමේ ගෞරවයට පාත්‍ර විය. සංචාරය අතරතුර, මහාචාර්ය Takahashi මහතා LNBTI සිසුන් සමග සාකච්ඡා සැසියක නිරත වූ අතර එහිදී සිසුන්ගේ ජපන් ප්‍රවීණතාවය සහ ඔවුන්ගේ උද්‍යෝගය පිළිබඳව ඔහුගේ විශේෂ අවධානය යොමුවිය. සිසුන්ගේ උසස් මට්ටමේ භාෂා කුසලතා පිළිබඳව පැහැදීමට පත් වූ මහාචාර්ය Takahashi මහතා දැනුම වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ගේ කැපවීම දිගටම පවත්වාගෙන යන ලෙසට ද  උපදෙස් ලබා දුන්නේය. ජපාන තොරතුරු තාක්ෂණ අංශයේ ඉහළ අවස්ථා සහ වෘත්තීය සාර්ථකත්වය ලබාගැනීමේ වැදගත්කම ද ඔහු මෙහිදී අවධාරණය කළේය.



## වෘත්තීන් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ අපේක්ෂාවෙන් ජපන් නියෝජිත කණ්ඩායමක් LNBTI වෙත

ශ්‍රී ලංකාවේ හා ජපානයේ පිහිටි, ජපන් සමාගම්වල ප්‍රමුඛ තනතුරු සඳහා LNBTI උපාධිධාරීන් බඳවා ගැනීමේ හැකියාවන් සොයාබැලීමේ අරමුණින් ජපානයේ නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔවුන්ට සත්කාරකත්වය ලබාදීම LNBTI මැදිහත්වීමෙන් සිදුවිය. මෙම සංචාරය LNBTI උපාධිධාරීන් සඳහා වූ අවස්ථාවන් සහතික කිරීමේ මහඟු අවස්ථාවක් ද විය.



## සංස්කෘතික හුවමාරුව විදහා දැක්වූ මහානාම විද්‍යාලයේ ජපන් වැඩමුළුව



කොළඹ මහානාම විද්‍යාලයේ ජපන් භාෂා සංගමය, 2023 නොවැම්බර් 23 වන දින සිසුන්ගේ ජපන් ප්‍රවීණතාවය ඉහළ නැංවීමේ අරමුණින් සංස්කෘතික හුවමාරු වැඩමුළුවක් සංවිධානය කළේය. Minami Munakatha මහත්මියගේ නායකත්වයෙන් යුත් ජපන් පදනම, ජපන් විශ්වවිද්‍යාල සිසුන් සිව්දෙනෙකු සහ Ikura Kazuyuki අධ්‍යක්ෂතුමා ඇතුළු පිරිසක් උත්සවයට සහභාගී විය. මෙම සංස්කෘතික සැමරුම සාර්ථක කර ගැනීමට අනුග්‍රහය සහ සහයෝගය ලබාදීම වෙනුවෙන් මෙහිදී අංජු හේවගේ මහත්මිය LNBTI කණ්ඩායමට කෘතඥතාව පළ කර සිටියාය. ශ්‍රී ලංකාවේ ජපන් පදනම විසින් සහජීවනය සංකේතවත් කරමින් මෙම උත්සවයට ජපන් සාම්ප්‍රදාය හා සංස්කෘතිය රැගත් විශේෂාංග එක් කර තිබීම ද විශේෂිත විය.

## LNBTI විසින් පානදුර බාලිකා විද්‍යාලයේ පැවැත්වූ IoT වැඩමුළුව

2023 නොවැම්බර් 28 වන දින LNBTI ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පානදුර කලාපයේ උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් පානදුර බාලිකා විද්‍යාලයේ IoT වැඩමුළුවක් සංවිධානය කරන ලදී. තොරතුරු තාක්ෂණය කේන්ද්‍ර කරගනිමින් උසස් පෙළ විභාගයට දරුවන් සූදානම් කරවීමේ අරමුණින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා න්‍යායාත්මක කරුණු සමඟ මෙම සැසිය මෙහෙයවන ලද්දේ LNBTI හි තොරතුරු තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චන්දන දේශප්‍රිය මහතා විසිනි. මෙහිදී සිසුන් IoT පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගත් අතර Arduino පද්ධති ක්‍රියාකාරම් පිළිබඳව ද අවබෝධයක් ලබාගත්හ.



## අලුතින් ආරම්භ කළ City Campus

LNBTI ජපන් තොරතුරු තාක්ෂණ විශ්වවිද්‍යාලය, මහරගම නගර මධ්‍යයේ සතර ගොඩනැගිල්ල තුළ සිය නව City Campus විවෘත කිරීමත් සමඟ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එම සමාරම්භක උත්සවය ජපන් සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන් නියෝජනය කරමින් LNBTI සභාපති Koga Michio මහතා සහ අධ්‍යක්ෂ Ikura Kazuyuki මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. LNBTI හි මෙම උපායමාර්ගික පියවර, සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා පහසු ඉඩකඩක් සමඟින් ශිෂ්‍ය අත්දැකීම් වර්ධනය කිරීම සඳහා ඇති කැපවීම ද පෙන්නුම් කරන්නකි. නව City Campus, LNBTI හි ආයතනික ව්‍යාප්තිය සංකේතවත් කරන අතර වඩා හිතකර ඉගෙනුම් පරිසරයක් ද විවර කරයි.



වැඩිදුර පුවත් දැනගැනීම සඳහා

අප්‍රේල් මස බඳවාගැනීම් සඳහා ලියාපදිංචි වීමට අමතන්න

077 336 0000

076 680 5555